# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1958/72 - 2016 මාර්තු මස 18 වැනි සිකුරාදා - 2016.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලදුව වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය, 2016 මාර්තු මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 මාර්තු මස 16 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි කෘෂිකර්ම අමාත්‍ය (අංක 26) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 5 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි 5 සිට 14 අයිතමයන් වෙනුවට පහත සඳහන් අයිතමයන් ආදේශ කිරීමෙන් ;

5. ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය
6. මාංශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය
7. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
8. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
9. පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය
10. සීමාසහිත ලංකා පොහොර සමාගම
11. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
12. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්
13. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම


1A - G 23188— 431 (2016/03)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එම නිවේදනයට අංක 1945/41 හා 2015.12.18 දිනැතිව කරන ලද සංශෝධනය අනුව ඇතුළත් කරන ලද විශේෂ කාර්යභාර අමාත්‍ය (අංක 50) ශීර්ෂයේ I වැනි II වැනි හා III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂයන් ඇතුළත් කිරීමෙන් :-

(51) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
| 1. ප්‍රාදේශීය සංවර්ධනය හා II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම) | * දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන් ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 2. ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළුව ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සුදුසු ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන් සම්බන්ධීකරණය කිරීම | | |
| 3. නුවරඑළිය, නුවර, මාතලේ, බදුල්ල, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | |
| 4. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයට පැවරී ඇති අනිකුත් සියලුම විෂයයන් | | |
| 5. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනය අධීක්ෂණය කිරීම | | |

04-395

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.